www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදය හා කැනඩාව තුල එෆ්බීඅයි ආයතනය කල අත් අඩංගුවට ගැනීම් එල්ටීටීඊයට එරෙහි යුද්ධය සඳහා වොෂින්ටනය දෙන තල්ලුව පිලිබඳ සලකුනකි

## FBI arrests in US and Canada signal Washington's backing for war against LTTE

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2006 අගෝස්තු 29**

පසු ගිය සතියේ සිදු කරන ලද එෆ්බීඅයි මෙහෙයුමක දී, නීති විරෝධී ආයුධ මිලට ගැනීමට උත්සාහ කිරීම, එක්සත් ජනපද නිලධාරීන්ට අල්ලස් දීමට තැත් කිරීම හා ශ්‍රී ලාංකික බෙදුම්වාදී කන්ඩායම වන දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊයට) සහාය දැක්වීම පිලිබඳ චෝදනා මත ආසන්න වශයෙන් එක්සත් ජනපද හා කැනඩානු පුරවැසියන් 12 දෙනෙකු සිර භාරයට ගන්නා ලදි. රාජකීය කැනඩානු අශ්වාරෝහක පොලීසිය හා වෙනත් එක්සත් ජනපද හා කැනඩානු අධිකාරයන් සමග එක්ව කල මෙම අත් අඩංගුවට ගැනීම් වනාහි 1997 දී එක්සත් ජනපදය එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් යැයි ලැයිස්තුගත කිරීමෙන් පසුව සිදු කෙරුනු එබඳු පලමු සිදුවීම යි.

ලෝන්ග් අයිලන්ඩ් ප්‍රදේශයේ දී, අවි ගනුදෙනුකරුවන් ලෙස පෙනී සිටි එෆ්බීඅයි ඒජන්තයන්ගෙන් නීති විරෝධී අවි මිලට ගැනීම සඳහා උත්සාහ කල අවස්ථාවේ දී අගෝස්තු 19 වන දා දෙමල ජාතිකයන් 5 දෙනෙක් සිර භාරයට ගන්නා ලදහ. යට කී ආයුධ අතරට රුසියාවේ නිෂ්පාදිත උරහිස මත තබා වෙඩි තබන 100 SA 18 අවි, පොලොව මත සිට ගුවනට විදින මිසයිල, 500 AK-47 ප්‍රහාරක රයිෆල හා වෙනත් අවි ඇතුලත් විය. එෆ්බීඅයි ඒජන්තයන් පවසන පරිදි, අත් අඩංගුවට ගත්තවුන් සොයමින් සිට ඇත්තේ කෆීර් ප්‍රහාරක ජෙට් යානාවලට වෙඩි තබා බිම හෙලීමේ හැකියාව සහිත මිසයිලයන් ය. රට තුල පුලුල් වෙමින් පවතින යුද්ධයේ දී එල්ටීටීඊ ස්ථානගත වීම් මත බෝම්බ හෙලනු පිනිස ශ්‍රී ලාංකික මිලිටරිය යොදා ගන්නේ මෙම ජෙට් යානාවන් ය.

දෙවන මෙහෙයුමක දී තවත් දෙමල ජාතිකයන් කන්ඩායමක් අත් අඩංගුවට ගත් අතර, ත්‍රස්තවාදී සංවිධාන පිලිබඳ එක්සත් ජනපද ලැයිස්තුවෙන් එල්ටීටීඊය ඉවත් කර ගැනීම උදෙසාත් රහසිගත තොරතුරු ලබා ගැනීම උදෙසාත් එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙස පෙනී සිටි එෆ්බීඅයි ඒජන්තයන්ට අල්ලස් ලබා දීමට තැත් කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට චෝදනා එල්ල කෙරුනි. එමෙන් ම, "එල්ටීටීඊයට ද්‍රව්‍යමය සහාය සැපයීම, මිලිටරි උපකරන හා ද්විප්‍රකාරව යොදා ගත හැකි තාක්ෂනය ලබා දීම, 'ප්‍රධාන පෙලේ' පුන්‍යායතන හා එක්සත් ජනපද බැංකු ගිනුම් හරහා අරමුදල් රැස් කිරීම හා මුදල් එකතු කිරීම" සම්බන්ධයෙන් ද ඔවුන්ට චෝදනා එල්ල විය.

"විත්තිකරුවන් එල්ටීටීඊ නායකත්වය සමග සමීපව සම්බන්ධ" යැයි ද "ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් පෞද්ගලිකව මුන ගැසී ඇතැ"යි ද එෆ්බීඅයි ආයතනය පැවසී ය. වැරදිකරුවන් බව ඔප්පු වුව හොත් ඔවුන් 35 වසරක් දක්වා වන සිර දඬුවමකට මුහුන දෙනු ඇත. සියලු දෙනා ම තමන් චෝදනා සම්බන්ධයෙන් නිර්දෝෂ බවට කරුනු ඉදිරිපත් කොට ඇති අතර, ඇප දීමකින් තොරව ඔවුන් රිමාන්ඩ් භාරයේ තබා තිබේ. ශ්‍රී ලංකාවේ දී, එල්ටීටීඊයේ මිලිටරි ප්‍රකාශක රාසයියා ඉලන්තිරියන් පුවත්පත්වලට මෙසේ පැවසී යඃ "අපට මේ පුද්ගලයන් සමග කිසි ම සම්බන්ධයක් නැහැ. මේ අප ක්‍රියා කරන විධිය නො වේ."

සිර භාරයට ගැනීම් සිදු කල කාලය හා එහි ස්වභාවය මගින් ඒවායේ දේශපාලනික ස්වරූපය පෙන්නුම් කෙරෙයි. සැකකරුවන්ගෙන් සමහරෙකු වසර හයක් පමන තිස්සේ දේශපාලන රැකවරනය යටතේ සිට ඇත්තේ වුව ද "විෂසෝර" එක්සත් ජනපද අධිකාරයන් මෙහෙයුම් දෙකක් ඔස්සේ අත් අඩංගුවට ගැනීම් සංවිධානය කලේ 2002 වසරින් පසු පලමු වතාවට ශ්‍රී ලංකාව තුල විවෘත යුද ගැටුම පුපුරා යන තත්ත්වයක් මධ්‍යයේ ය. ආකාරගතව සතුරුකම් නැවැත්වීමක් සඳහා කැඳවුම් කල ද මේ අත් අඩංගුවට ගැනීම් වනාහි එල්ටීටීඊයට එරෙහිව ගෙන යන යුද්ධයේ දී බුෂ් පරිපාලනය විවෘතව ශ්‍රී ලංකාන්ඩුව පසෙකින් සිටින්නේ ය යන්න පිලිබඳ තවත් ඇඟවුමකි.

"ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධයේ දී ලද ඇඟට දැනෙන සහායක්" ලෙස හඳුන්වමින් අත් අඩංගුවට ගැනීම්වලට සුභ පැතූ ශ්‍රී ලංකාවේ ආරක්ෂක කටයුතු පිළිබඳ ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල, "එල්ටීටීඊය මත යොදන පීඩනය දැඩි කරන" ලෙස යුරෝපා සංගමයෙන් ද ඉල්ලා සිටියේ ය. සිංහල අන්තවාදී කන්ඩායම් සැනෙකින් පොලිස් මෙහෙයුම ප්‍රශංසාවට ලක් කලේ ය. දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරයේ නායක ඇල්ලේ ගුනවංශ ජාතික රූපවාහිනියට කියා සිටියේ තම කන්ඩායම "අතිශයින් සතුටට පත්" වූ බව යි. පසු ගිය සතියේ දක්ෂිනාංශික අයිලන්ඩ් පුවත්පතේ පල වූ කතුවැකියකින් කියැවුනේ නිව් යෝකයේ දී සිදු වූ අත් අඩංගුවට ගැනීම් මගින් "එක්සත් ජනපදය සිය ත්‍රස්ත විරෝධී පිලිවෙත ක්‍රියාකාරිත්වය සමග මුසු කිරීමට පටන් ගනිමින් සිටින්නේ ය" යන්න පෙන්නුම් කෙරන බව යි. "එක්සත් ජනපදය දිගින් දිගට ම නිවැරදි දිසාවට ගමන් කිරීම සතුටට කරුනකි."

සිද්ධිය සම්බන්ධයෙන් අදහස් දක්වමින් එක්සත් ජනපද නීතිපති ඇල්බර්ටෝ ගොන්සාලේස් මෙසේ ප්‍රකාශ කලේ යඃ "... එල්ටීටීඊය නමින් දන්නා ශ්‍රී ලාංකික සංවිධානයේ සාමාජිකයන් හා සහායකයන් ක්‍රියාවට නැංවූ බහුවිධ මුහුනුවරින් යුතු කූට උපක්‍රමය පෙන්නුම් කරන්නේ ත්‍රස්තවාදීන්ට එරෙහි ගෝලීය යුද්ධය සම්බන්ධයෙන් දිගින් දිගට ම සුපරීක්ෂාකාරීව සිටීමේ අවශ්‍යතාව යි." එෆ්බීඅයිහි කාර්ය භාර විශේෂ නියෝජිත කනිෂ්ඨ ලෙස්ලි වයිසර් සඳහන් කලේ, "ශ්‍රී ලංකාවේ සිදු කර ගෙන යන ත්‍රස්ත මෙහෙයුම් සඳහා අවශ්‍ය අරමුදල් හා ආයුධ ලබා ගැනීම පිනිස දෙමල කොටින්ට පවත්නා හැකියාවට මෙහෙයුම මගින් දරුනු ලෙස හානි පමුනුවා ඇති" බව යි.

දෙමල බෙදුම්වාදීන් "ත්‍රස්තවාදය පිලිබඳ ගෝලීය යුද්ධය" තුලට ඇතුලු කර ගැනීම මගින් අවධාරනය වන්නේ බුෂ් පරිපාලනයේ සියල්ලන්-අල්ලනු කියමනේ විකාරරූපී බවයි. එල්ටීටීඊය පොලොවේ සිට ගුවනට විදින මිසයිල මිල දී ගැනීම සඳහා උත්සාහ දරමින් සිටින්නේ නම් ඊට හේතු වී ඇත්තේ දැන් සිදු වන සටනේ දී එල්ටීටීඊ ස්ථානගතවීම් වලට පහර එල්ල කිරීමට පමනක් නො ව ප්‍රදේශයේ ජනයා භීතියට පත් කිරීම ද උදෙසා ශ්‍රී ලාංකික මිලිටරිය අනුකම්පා විරහිත අයුරින් තම යුද ගුවන් යානා යොදා ගැනීම යි. අගෝස්තු 14 වන දා, ප්‍රථමාධාර පාඨමාලාවකට සහභාගි වෙමින් සිටි යොවුන් පාසල් සිසුන් 61 දෙනෙකු ඝාතනය කරමින් ගුවන් හමුදාව එල්ටීටීඊ පුහුනු කඳවුරක් යැයි කියනු ලැබෙන ස්ථානයකට බෝම්බ හෙලී ය.

එෆ්බීඅයිහි අත් අඩංගුවට ගැනීම් සිදු වූයේ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු වන ස්ටීව් මාන් අගෝස්තු 17 වන දා ශ්‍රී ලංකාවෙහි සංචාරය කිරීමෙන් අනතුරුව ය. ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ හා හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා හමු වූ මාන්, හමුදාවේ මෙහෙයුම් සිදු කරන ලද්දේ "ආරක්ෂාව පතා" යැයි ඔවුන් කරන අසත්‍ය ප්‍රකාශය පිලිගත්තේ ය. මාස ගනනක් තිස්සේ සැඟවුනු ප්‍රකෝප කිරීම් කර ගෙන යාමෙන් පසුව ජුලි 26 වන දා එල්ටීටීඊ පාලන ප්‍රදේශය තුල පවතින මාවිල්ආරු අමුන මුදා ගැනීම සඳහා මිලිටරිය බලගතු ආක්‍රමනයක් දියත් කල අතර, එය 2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කිරීමකි. එල්ටීටීඊය පලි ගැනීමේ ප්‍රහාර එල්ල කිරීම නිසා එවක් පටන් සටන පුලුල් වී තිබේ.

"සතුරුකම් නැවැත්වීම සම්බන්ධයෙන් එල්ටීටීඊයට ඍජු, පැහැදිලි, ක්ෂනික වගකීමක් ඇතැ"යි මාන් ප්‍රකාශ කලේ ය. අනතුරුව එල්ටීටීඊයට එරෙහිව රාජපක්ෂ ගෙන යන යුද්ධය සඳහා වොෂින්ටනය තල්ලුව දෙන බව අඟවන අදහස් දැක්වීමක දී ඔහු කියා සිටියේ, " අප ලෝක පරිමානව එයට [ත්‍රස්තවාදයට] එරෙහිව සටන් වදිමින් සිටින්නේ නම් අප මේ ශ්‍රී ලංකාවේ දී එය නොකරන්නේ ඇයි?" ද යන්න එක්සත් ජනපදයෙන් ඇසිය යුතු නොවන බවයි.

## එක්සත් ජනපද පිලිවෙත

එල්ටීටීඊයට එරෙහි යුද්ධය සඳහා බුෂ් පරිපාලනය ලබා දෙන සහායෙන් නිශ්චිත උපායික වෙනසක් සනිටුහන් වේ. 2002 දී, 20 අවුරුදු සිවිල් යුද්ධය අවසන් කිරීම පිනිස එල්ටීටීඊය හා එක්සත් ජාතික පක්ෂය නායකත්වය දුන් ආන්ඩුව අතර සටන් විරාමයක් අත්සන් කිරීමට ද සාකච්ඡා සඳහා ද ප්‍රධාන බලවතුන් සමග එක්ව එක්සත් ජනපදය තල්ලුව දුන්නේ ය.

ඔවුන් ඇෆ්ඝනිස්ථානය මිලිටරිමය වශයෙන් වාඩි ලා ගනිමින් සිටියදීම, ඊනියා සාම ක්‍රියාවලිය උදෙසා වොෂින්ටනය දුන් තල්ලුව ශ්‍රී ලාංකික මහජනතාව මුහුන දී සිටින ශෝචනීය තත්ත්වය පිලිබඳ උත්සුකතාවක් නිසා කිසි දා පැන නැගුනේ නො වේ. ඒ වෙනුවට, විශේෂයෙන් ඉන්දියාව තුල එක්සත් ජනපදයේ ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන් වැඩෙන වැදගත්කමක් අත් කර ගනිමින් පැවති තතු තුල, ශ්‍රී ලාංකික යුද්ධය ඉන්දියානු උපමහාද්වීපය සම්බන්ධයෙන් අන්තරායකාරී, අස්ථාවරකාරී සාධකයක්ව පැවතුනි.

සිය ත්‍රස්තවාදී සංවිධාන පිලිබඳ ලැයිස්තුවෙහි එල්ටීටීඊය රුවා ගෙන සිටින එක්සත් ජනපදය ගැටුම සම්බන්ධයෙන් ඇති කර ගන්නා දේශපාලන විසඳුමක දී එල්ටීටීඊය උදෙසා වෙන් කෙරෙන කවර භූමිකාවක් වුව ද සීමාසහිත විය යුතුව ඇතැයි අවධාරනය කලේ ය. දෙමල ඊලම නමින් වෙන ම රාජ්‍යයක් සඳහා එල්ටීටීඊය කරන ඉල්ලීමට විරුද්ධ වූ එය අවසන් දේශපාලනික ගනුදෙනුවක් සිදු වීමට පෙර පවා

ප්‍රචණ්ඩත්වය නිල වශයෙන් අත් හැර නිරායුධ වීම ආරම්භ කල යුතු යැයි ගරිල්ලා සංවිධානයෙන් යලි යලිත් ඉල්ලා සිටියේ ය.

2003 දී සාම සාකච්ඡා බිඳ වැටීමෙන් හා 2004 දී එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව නෙරපා හැරීමෙන් අනතුරුව, විශේෂයෙන් පසු ගිය නොවැම්බරයේ රාජපක්ෂ ජනාධිපති ලෙස තේරී පත් වීමෙන් පසුව එල්ටීටීඊයට එරෙහි වඩාත් ආක්‍රමනකාරී ආකල්පයකට බුෂ් පරිපාලනය තල්ලුව දී තිබේ.

වොෂින්ටනයේ ආකල්පයෙහි ඇති වූ වෙනස් වීම ශ්‍රී ලංකාවේ දී ඇමරිකානු වානිජ මන්ඩලය ඉදිරියේ එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ් කල කතාවකින් ජනවාරියේ දී ප්‍රකාශයට පත් විය. එල්ටීටීඊයට කල සෘජු අනතුරු ඇඟවීමක දී ඔහු මෙසේ ප්‍රකාශ කලේ යඃ "කොහොම නමුත්, එල්ටීටීඊය සාමය අත හැරීමට තීරනය කලොත් ඔවුන් වඩා බලගතු, වැඩි ශක්‍යතාවකින් යුක්ත ඒ වගේ ම වඩා අධිෂ්ඨාන සහගත ශ්‍රී ලාංකික මිලිටරියකට මුහුන දෙන බව පැහැදිලි කර දෙන්න අපට අවශ්‍ය යි. යුද්ධය කරා ආපසු යාමකින් ඇතිවන විනාශය ඉහල යාම අපට අවශ්‍යයි."

ලන්ස්ටඩ් එක්සත් ජනපදය ගන්නා පියවරයන් මාලාවක් ලැයිස්තුගත කලේ ය. "ප්‍රති-ත්‍රස්තවාදී ආරම්භකත්වයන් සඳහා උදව් කිරීමට දරන ප්‍රයත්න හා නීති විරෝධී මූල්‍ය ගනුදෙනු අවහිර කිරීම ඇතුලු අපේ මිලිටරි පුහුනුව හා සහාය සැපයීමේ වැඩ සටහන් තුලින්, තම ජනතාවට රැකවරනය සලසන්නටත් සිය අවශ්‍යතාවන් ආරක්ෂා කර ගන්නටත් ශ්‍රී ලංකාන්ඩුවට පවතින හැකියාව හැඩ ගස්වා ලන්න අපි උපකාර කරමින් සිටිනවා."

එක්සත් ජනපද දක්ෂින ශාන්තිකර බලඇනියේ ඉහල නිලධාරීහු ශ්‍රී ලාංකික මිලිටරියේ තත්ත්වය තක්සේරු කිරීම පිනිස උතුරු හා නැගෙනහිර යුද පෙරමුනුවලට පවා නිතිපතා සංචාරය කරති. කැනඩාවේ හා යුරෝපා සංගමයට අයත් රටවල පුලුල් ලෙස විසිරී සිටින දෙමල සරනාගතයන්ගෙන් දේශපාලනික හා මූල්‍යමය සහාය ලබා ගැනීමට පවතින හැකියාව අවහිර කරමින් ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස සලකා එල්ටීටීඊය තහනම් කිරීමට වසර ආරම්භයේ පටන් ම එක්සත් ජනපදය එම රටවලට බලපෑම් කර තිබේ.

වොෂින්ටනයේ වැඩෙන දේශපාලනික හා මිලිටරිමය සහයෝගිතාව මගින් සිදු වී ඇත්තේ සාම සාකච්ඡා ප්‍රවර්ධනය කරනු වෙනුවට එල්ටීටීඊය කෙරෙහි වඩාත් ආක්‍රමනකාරී ආකල්පයක් ගැනීම සඳහා ශ්‍රී ලංකාන්ඩුව, සන්නද්ධ හමුදා හා විවිධාකාර සිංහල අන්තවාදී පක්ෂ දිරිමත් කිරීම පමනකි. අනෙක් අතට, බුෂ් පරිපාලනය සිය ගෝලීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා කොලඹ ආන්ඩුවේ සහාය ලබා ගැනීමට උත්සාහ කරමින් සිටී. ශ්‍රී ලංකාවේ වරායන්ට, ගුවන් තොටුපොලවලට හා අහස් තලයට පුලුල් ලෙස ප්‍රවේශ වීමට එක්සත් ජනපදයට ඉඩ ලැබෙන අත්පත්කර ගැනීමේ සහ හරස් සේවා සඳහා වන ගිවිසුමක් (Acquisition and Cross Service Agreement) ඇති කර ගැනීම සඳහා දැනට මත් සාකච්ඡාවලට මුල පුරා තිබේ.

පසු ගිය සතියේ එෆ්බීඅයි ආයතනය කල අත් අඩංගුවට ගැනීම්වලට ආසන්න කාල සීමාව තුල දී, එක්සත් ජනපදය සම්බන්ධයෙන් ගත් කල ශ්‍රී ලංකාව මූලෝපායිකව වැදගත් වීමට පවත්නා ඉඩකඩ මතු කර දක්වමින් අදහස් කීපයක් එලිමහනට ආයේ ය. එක්සත් ජනපද මිලිටරිය හා ඔත්තු සේවා සංස්ථාපිතය සමග සමීප සබඳතා ඇති එක්සත් ජනපද උපදේශකයෙකු වන ස්ට්‍රැට්ෆර් පසු ගිය සිකුරාදා "ශ්‍රී ලංකාවඃ පවත්නා මූලෝපායික විභවය" යන මැයෙන් යුතු අදහස් දැක්වීමක් පල කලේ ය. එහි මෙසේ කියැවේඃ

"ශ්‍රී ලංකාවේ පිහිටීමේ ස්වභාවය නිසා එය භූ දේශපාලනික වශයෙන් තීරනාත්මක වන බොහෝ තැන්වලට සමීපව ස්ථානගත වේ. අසල්වැසි පකිස්ථානය හා බංග්ලා දේශය ඉස්ලාම්වාදී සටන්කාමිත්වය සමග පොර වැදී සිටින අතරතුර ජාත්‍යන්තර පද්ධතිය තුල ඉන්දියාවේ වැදගත්කම හා ආනුභාවය දිගින් දිගට ම වර්ධනය වෙයි. එක්සත් ජනපද මිලිටරිය මෙම රටවලට ශ්‍රී ලංකාවේ පවතින සමීප භාවයේ ඇති ප්‍රයෝජනවත්කම වටහා ගනියි. 2002 දී, වොෂින්ටනය හා කොලඹ අතර පුලුල් ආරක්ෂක ගිවිසුමක් අත්සන් කෙරුනි. ඒ යටතේ, එක්සත් ජනපද මිලිටරි පුහුනුව හා උපකරන ලබා දීමට හුවමාරුවක් වශයෙන් දේශීය වරායවල දී එක්සත් ජනපද නැව් අලුත්වැඩියා කර ගැනීමටත් ඒවාට ඉන්ධන පුරවා ගැනීමටත් ශ්‍රී ලංකාව ඉඩ සලසා දුන්නේ ය. ඇෆ්ඝනිස්ථානයෙහි මෙහෙයුම්වලට සම්බන්ධ වී සිටි යූඑස්එස් සයිඩ්ස් වැනි එක්සත් ජනපද යුද නැව් මේ ගනුදෙනුව යටතේ කොලඹ වරාය ප්‍රයෝජනයට ගත්තේ ය."

එම ලිපිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරලේ පිහිටි ගැඹුරු ජලය සහිත වරායක් වන, එමෙන් ම වත්මන් සටන් මධ්‍යයෙහි පිහිටා තිබෙන ත්‍රිකුනාමලයේ මූලෝපායික වැදගත්කම මතු කර දැක්වී ය. "කෙසේ හෝ සාමය ස්ථාපනය කෙරුන හොත් ලෝකය තුල පවතින ගැඹුරු ම ස්වාභාවික වරායක් වන ත්‍රිකුනාමලය නිසැක වශයෙන් ම එක්සත් ජනපද මිලිටරියේ අපේක්ෂා ලැයිස්තුව තුල පෙල ගැස්වෙනු ඇතැ"යි එය අදහස් දැක්වී ය. එක්සත් ජනපදය උදව් කිරීම ප්‍රතික්ෂේප කල හොත් අනෙකුත් බලවතුන් ඉදිරියට එනු ඇතැයි ස්ට්‍රැට්ෆර් අනතුරු ඇඟවී ය. "මේ අතරවාරයේ, චීනය හා පකිස්ථානය ඉන්දියාවේ පහල

මායිමට ලඟා වීමේ මෙවලමක් ලෙස කොටින් සමග ගෙන යන සටනේ දී ශ්‍රී ලංකාන්ඩුවට සහාය දීමේ ප්‍රයෝජනවත්කම හඳුනා ගෙන තිබේ," යැයි එය ප්‍රකාශ කලේ ය.

එක්සත් ජනපදය එල්ටීටීඊයට එරෙහිව මුලු මහත් ශක්තිය ම යොදා ගෙන කරන ආක්‍රමනයකට දේශපාලනිකව හා ද්‍රව්‍යමය වශයෙන් සහාය දීමට සූදානම් ද යන්න ඉදිරියේ දී දැක ගත හැකි වනු ඇත. කෙසේ වුව ද, එල්ටීටීඊයට ජාත්‍යන්තරව ලැබෙන සහාය හා සැපයුම් මාර්ග කපා හෙලීම සඳහා මෑත කාලීනව එෆ්බීඅයි ආයතනය සිදු කල අත් අඩංගුවට ගැනීම් ද තව දුර පියවරයන් ගන්නා බවට කල ඇඟවුම් ද අපාලිත සිවිල් යුද්ධයක රට ගිල්වමින් තිබෙන මිලිටරි ක්‍රියාවන් තීව්‍ර කිරීම පිනිස රාජපක්ෂගේ ආන්ඩුව දිරිමත් කරනවා පමනකි.

© www.wsws.org